**සීමාසහිත කොළදෙණිය හයිඩ්‍රෝපවර් (පුද්ගලික) සමාගම - 2018**

-------------------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**-------------------**

**1.1 මතය**

**--------**

සීමාසහිත කොළදෙණිය හයිඩ්‍රෝපවර් (පුද්ගලික) සමාගමේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයකින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**--------------------------**

මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං වි ප්‍ර) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සඳහා විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කෙරේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-----------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාගම අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

* වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන්, වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

* අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

* යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අදාළත්වය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමනාකාරීත්වය විසින් කරන ලද අදාළ හෙළිදරව් කිරීම් ඇගයීම.

* සිද්ධීන් හා තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කළමනාකරණයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

* සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය, සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව ඇගයීම.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2** **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය සහ 12 වගන්තිය පරිදි, පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත පරිදි වේ.

(ආ) මාගේ මතය වන්නේ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම විසින් පවත්වා ගෙන ගොස් ඇති බව,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල බව,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුකූල බව

- ඉකුත් වර්ෂයේදී මා විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් ඇතුළත් බව,

- සමාගමේ පාලක මණ්ඩලයේ කිසිඳු සාමාජිකයෙකු සමඟ කිසිඳු ගිවිසුමක් සඳහා සෘජු හෝ වක්‍ර බැඳීමකට ඇතුළත් වී ඇති බව මාගේ අවධානයට ලක් නොවීය.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු.70,669,387 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.69,585,957 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල රු.1,083,430 ක වර්ධනයක් දැක්වුණි. විදුලිබල උත්පාදන ආදායම රු.1,669,190 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලවල මෙම වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | 2018 | 2017 |
|---|---|---|
| **දළ ලාභ අනුපාතය (ප්‍රතිශතය)** | 58 | 60 |
| ජංගම අනුපාතය (වාර ගණන) | 1:39 | 1:16 |

ප්‍රධාන වශයෙන් රු.මිලියන 2.8 කින් විකුණුම් පිරිවැය වැඩිවීම හේතුවෙන් දළ ලාභ අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 2 කින් අඩු වී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**කාර්යසාධනය**

සමාගමේ ප්‍රධාන අරමුණ වන්නේ, ජාතික විදුලිබල පද්ධතියට විදුලිබල නිෂ්පාදනය හා විකිණීම සඳහා කුඩා ජල විදුලිබල පිරියතක් ඉදිකිරීම, මෙහෙයුම් කිරීම හා කළමනාකරණය කිරීමයි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ හා ඉකුත් වර්ෂ 04 ක සමාගමේ විදුලිබල උත්පාදනය සහ එයින් උපදවන ලද ආදායම පහත දැක්වේ.

| වර්ෂය | විදුලිබල උත්පාදනය | ආදායම |
|---|---|---|
| | කිවොපැ | රු.මිලියන |
| 2018 | 5,544,438 | 90.10 |
| 2017 | 5,461,989 | 88.43 |
| 2016 | 4,692,097 | 75.76 |
| 2015 | 6,080,937 | 97.23 |
| 2014 | 5,753,953 | 91.54 |

ශක්‍යතා අධ්‍යයනය සිදු කරන අවස්ථාවේදී ඇස්තමේන්තුගත විදුලිබල උත්පාදනය කිවොපැ 4,688,086 ක් වුවද සමාගමේ තථ්‍ය විදුලිබල උත්පාදනය ඇස්තමේන්තුගත සංඛ්‍යාවට සාපේක්ෂව ඉතා ඉහළ අගයක් ගෙන ඇත.

**5.** **තිරසර සංවර්ධන ඉලක්ක**

2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනතේ නියම කරන ලද පරිදි 2030 වර්ෂය සඳහා එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුකූල වන ලෙස සියලු රාජ්‍ය ආයතන කටයුතු කළ යුතුය. අදාළ අමාත්‍යාංශයෙන් උපදෙස් ලැබී නොතිබුණද, සමාගම විසින් එහි විෂය පථයට අදාළ වන පරිදි තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් සමහර කාර්යයන් ක්‍රියාත්මක කර තිබුණි. කෙසේ වුවද, සමාගම විසින් තවදුරටත් සපුරා ගත යුතු තිරසර සංවර්ධන ඉලක්ක හා එහි විෂය පථයට අදාළ වන පරිදි ප්‍රගතිය ප්‍රමාණය කිරීම සඳහා සුදුසුවන දර්ශක හඳුනාගත යුතුය.